## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
## 2020.02.03

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.02.03 වන දින පෙ.ව. 9.00ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමන් ප්‍රමුඛ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දකුණු පළාත් සභාවේ ගරු සභාපතිතුමන්, පළාත් පාලන ආයතනවල ගරු සභාපතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි දේශපාලන නායකත්වය, සියළුම රාජ්‍ය හා අනෙකුත් ආයතනවල නිලධාරීන් ද ඇතුළුව පැමිණ සිටි සියළුම දෙනා දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර, සපිරි ගමක් වැඩසටහන, රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන, ගමට ගෙයක් රටට සෙතක් වැඩසටහන, වාරි සෞභාග්‍යා වැඩසටහන, මහ කන්නය සඳහා වී මිල දී ගැනීම, ඩෙංගු ව්‍යාප්තිය අවම කිරීම, රිය අනතුරු අවම කිරීම සඳහා පියවර ගැනීම සහ ඕකෙවෙල නව ප්‍රාදේශීය ලේකම් ගොඩනැගිල්ල විවෘත කිරීම ආදී වැඩසටහන් 2020 වසරේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලික කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බවත්, එහිදී ඇතිවන මූල්‍ය ප්‍රවාහයේ බාධාවන් සහ ආයතන අතර පවතින නීති රීති ගැටුම් අවම කර ගැනීම සඳහා දේශපාලන නායකත්වයේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි.

2019.12.18 දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභාසම්මත කරන ලදි. ඉන් අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **01** | **2019.12.18 රැස්වීමේ දී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය** | | | | |
| 1.1 | පොදු | හම්බන්තොට නව රෝහල සංවර්ධනයෙන් පසු ව්‍යාපාර අහිමි වූවන් සඳහා විකල්ප ඉඩම් ලබා දීම | මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට අපේක්ෂිත වන බවත්, ඉන් අනතුරුව විකල්ප ස්ථාන ලබා දීම සම්බන්ධයෙන් තීරණ ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි. | රෝහල ආශ්‍රිතව ඉදිකිරීමට නියමිත සාප්පු සංකීර්ණයෙන් අදාල පුද්ගලයන්ට විකල්ප ලබා දෙන ලෙසත්, නීත්‍යානුකූලව එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව තාවකාලික විසඳුමක් ලෙස මාර්ගය අවට වෙළඳාම් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය /නාගරික කොමසාරිස් - හම්බන්තොට |
| 1.2 | පොදු | කවශිමා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර භාර දීම | මේ වන විට 90% වැඩ අවසන් කර ඇති බවත්, පෙබරවාරි මාසය අවසානයේ දී සියළු කටයුතු අවසන් කිරීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු කඩිනම් කර භාර දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නාගරික කොමසාරිස් - හම්බන්තොට |
| 1.3 | මාර්ග සංවර්ධන | හම්බන්තොට නව දිස්ත්‍රික් මහ රෝහල අසල මාර්ගයේ සංඥා පද්ධති සකස් කිරීම හා විදුලි පහන් සවි කිරීම | මේ වන විට එම කටයුතු සිදුකරමින් පවතින බවත්, ප්‍රධාන මාර්ගය හා පිවිසුම වෙනස් කිරීමට නියමිත බැවින් ඒ අනුව සැලසුම් සකස් විය යුතු බවට සාකච්ඡා විය. | වටරවුම් පාර ප්‍රධාන මාර්ගය ලෙස සංවර්ධනය වන බැවින්, රෝහලේ ප්‍රධාන පිවිසුම ලබා දීම ඒ අනුව වෙනස් වන අතර ඊට අදාල පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / ප්‍රාදේශීය ලේකම්- හම්බන්තොට |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.4 | ජල සම්පාදන | උස්වැව ගමට පානීය ජලය ලබා ගැනීම | ව්‍යාපෘතිය මඟින් තව දුරටත් ජල නල දීර්ඝ කිරීමේ ශක්‍යතාවයක් නොමැති බවත්, යෝජිත මිද්දෙනිය - අඟුණකොලපැලැස්ස ජල යෝජනා ක්‍රමය මඟින් එම ප්‍රදේශය ආවරණය වන බවත් ප්‍රකාශ කරන ලදි. | ඒ සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 1.5 | ඉඩම් | සූරියවැව මිරිජ්ජවිල අඩි 100 මාර්ගයේ ඉඩම් අහිමි වූවන් සඳහා වන්දි ලබා දීම | අත්පත්කරගෙන ඇති ඉඩම් කට්ටි කිහිපයක වන්දිලාභීන් හඳුනාගැනීම ගැටළු සහගත බැවින් මේ සඳහා කමිටුවක් පත්කර ඇති බවටත්, ඉන් පසු කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය. | ඒ සම්බන්ධයෙන් අමාත්‍යතුමා දැනුවත් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලද අතර, වන්දි ගෙවීම් කටයුතු කඩිනමින් අවසන් කළ යුතු බවට උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ (ඉඩම්) - මාර්ග සංවර්ධන අමාත්‍යාංශය / නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 1.6 | සංස්කෘතික | 1818 කැරැල්ලේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් රාජද්‍රෝහීන් ලෙස නම් කර ඝාතනය කරන ලද විරුවන් දේශප්‍රේමීන් ලෙස නම් කිරීම | ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර ඇති මීට අදාල ගැසට්පත්‍ර පරිශීලනයේ දී මෙම විරුවන් සම්බන්ධ තොරතුරු සොයා ගැනීමට අපහසු වී ඇති බවත්, තව දුරටත් පරීක්ෂා කරමින් පවතින බවත් ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්තා කර ඇති බව ප්‍රකාශ කරන ලදි. | මේ පිළිබඳ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ හැකි පාර්ශවයකට තොරතුරු ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී - හම්බන්තොට |
| 1.7 | ජල සම්පාදන | නෝනාගම ජල සම්පාදන ක්‍රමය බරවකුඹුක දක්වා දීර්ඝ කිරීම | අදියර 2 යටතේ ක්‍රියාත්මක කළ හැකි බවත්, ඒ සඳහා ඇස්තමේන්තුව නැවත සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | ඇස්තමේන්තුව සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර, අමාත්‍යාංශයට යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 1.8 | මාර්ග සංවර්ධන | තිස්ස ප්‍රදේශයේ මාර්ග ජලයෙන් යට වීම | අවශ්‍ය ප්‍රතිපාදන පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරන ලදි. | දෙපාර්තමේන්තුවේ සංවර්ධන වියදම්වලින් මුදල් ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | පළාත් පාලන සහකාර කොමසාරිස් - හම්බන්තොට |
| 1.9 | ඉඩම් | පාරම්පරික ඉඩම් සඳහා තක්සේරු ලබා දීමේ දී මතු වී ඇති ගැටළු | අභියාචනා සඳහා ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍ර සැලකිල්ලට ගනිමින් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ | එම කටයුතු කඩිනමින් සිදු කර ජනතාවට සාධාරණය ඉටු කරන ලෙස උපදෙස් ලබා දුනි. ඒ පිළිබඳව කමිටු යෝජනාවක් ලෙස දකුණු | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (පළාත්) / නියෝජ්‍ය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | නියෝගය පරිදි අසාධාරණයට ලක් වී ඇති ඉඩම් හිමිකරුවන් සඳහා විසඳුම් ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදි. | පළාත් ගරු ආණ්ඩුකාරවර වෙත දන්වා යවන මෙන් උපදෙස් ලබා දුනි. | ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) |
| **2020.02.03 රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ** | | | | | |
| **02** | **සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | | |
| 2.1 | සංවර්ධන ව්‍යාපෘති | 2019 වර්ෂයේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතවල අතැති බිල්පත් වටිනාකම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය, බුද්ධ ශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති 3332ක් සඳහා රු.මි. 1713.27ක ප්‍රතිපාදන අනුමත වූ බවත්, එහි වියදම රු.මි. 961.13ක් බවත් අතැති බිල්පත් වටිනාකම රු.මි. 701.57ක් වන බවත් ප්‍රකාශ කරන ලදි. | අතුරු සම්මත ගිනුමෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන්ව නොමැති බැවින් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කොට අදාල ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බව දන්වන ලදි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.2 | සංවර්ධන ව්‍යාපෘති | "සපිරි ගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 | සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ ග්‍රාමීය ප්‍රජා කමිටු හරහා විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම සිදු කරන බවත්, ඒ සඳහා එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට රු.මි. 2 ක ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් එක් ව්‍යාපෘතියක අවම වටිනාකම රු.මි. 02 ක් හා උපරිමය රු.මි. 05ක් බවත්, ව්‍යාපෘති 1036ක් සඳහා රු.මි. 1,152.00ක ප්‍රතිපාදන අනුමත වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත | කඩිනමින් මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වන ලදි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | පැවරෙන අතර, සියළුම ආයතන මේ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | | |
| **03** | **විශේෂ කරුණු** | | | | |
| 3.1 | සෞඛ්‍ය | ඩෙංගු මර්ධන කටයුතුවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඩෙංගු අධි අවධානම් කලාප ලෙස තංගල්ල, වලස්මුල්ල, හම්බන්තොට හඳුනාගෙන ඇති බවත්, අඩු අවධානම් කලාප ලෙස අම්බලන්තොට, අඟුණකොළපැලැස්ස, කටුවන, සූරියවැව, ලුනුගම්වෙහෙර, බෙලිඅත්ත, වීරකැටිය හා ඕකෙවෙල හඳුනාගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදි. ග්‍රාමීය හා ප්‍රාදේශීය ඩෙංගු මර්දන කමිටුවල ක්‍රියාකාරීත්වය අඩාල වීම මීට හේතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>2019 වර්ෂයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රෝගීන් 1788ක් වාර්තා වී ඇති අතර ඉන් වැඩි පිරිස තංගල්ල ප්‍රදේශයේ වන බවත්, මරණ 01ක් වාර්තා වී ඇති බවත්, 2020 ජනවාරි මාසය වන විට රෝගීන් 163ක් වාර්තා වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි.<br>ව්‍යාප්තිය වැඩි ප්‍රදේශවල පමණක් සක්‍රීය වී මර්දන කටයුතු සිදුකිරීම වෙනුවට 2020 වර්ෂය පුරා අන්තර් පාර්ශවීය සහයෝගයෙන් පෞද්ගලික වගකීමක් සේ සලකා ව්‍යාප්තිය අවම කිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි. | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝග මර්දනය සඳහා සියළු පාර්ශව සහයෝගය ලබා ගනිමින් ඩෙංගු මර්ධන කමිටු සක්‍රිය කිරීමට තීරණය විය.<br>අක්‍රිය වී ඇති කමිටු සතියක් ඇතුළත සක්‍රිය කරන ලෙසත්, කමිටු අතර අන්තර් පාර්ශවීය සහයෝගය පවත්වාගනිමින් දිගින් දිගටම කමිටු රැස්වෙමින් මර්දන කටයුතු සඳහා සහාය වන ලෙස උපදෙස් ලබා දුන් අතර, පෙබරවාරි මස 24 වන දින සිට සතිය ඩෙංගු මර්දන සතිය ලෙස නම් කිරීමට තීරණය කරන ලදි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඒ සඳහා කමිටු පත් කර පොදු ස්ථාන පවිත්‍ර කිරීම් ආදිය සිදු කරන ලෙසත් සතියක් ඇතුළත වාර්තාවක් ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු / පළාත් පාලන සහකාර කොමසාරිස් / සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු<br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 3.2 | සෞඛ්‍ය | තිස්සමහාරාම පච්චිමාරාම පන්සල ඉදිරිපිට කාණු පද්ධතිය වැසී යාම හේතුවෙන් මතු වී | මෙම කානු පද්ධතිය වැසී යාම හේතුවෙන් ජලය එක් රැස්වීම නිසා ඩෙංගු මදුරුවන් බෝ වීම වර්ධනය වී ඇති බවත් ප්‍රකාශ කරන | සාකච්ඡාවක් පවත්වා ඉඩම් හිමියන්ගේ එකඟතාවය ලබා ගෙන එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / විධායක |

| අ.අ | විෂය ක්ෂේත්‍ර ය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | ඇති ගැටළු | ලද අතර, ඉඩම් මායිම්වලින් කාණු පද්ධතිය නිසි පරිදි සකස් කර කොන්ක්‍රීට් ආවරණ යෙදීම සුදුසු බව යෝජනා කරන ලදි. | | ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| **04** | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඉදිරිපත් වී ඇති කරුණු** | | | | |
| 4.1 | වාරි මාර්ග | පොකුණුවිල බස්නාව හරස්වීම හේතුවෙන් මතුවී ඇති ගැටළු | රිදියගම ව්‍යාපාරයට අයත් මෙම බස්නාව හරහා යන ගොඩගම ධම්මාවාස පාරෙහි ඇති පාලම ඉවුරත් සමඟ ගිලා බැසීම හේතුවෙන් කුඹුරුවල ජලය බැස්සවීමට නොහැකිව ගොවීන් අපහසුතාවයට පත් වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | එම මාර්ගය නැවත පිළිසකර කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව |
| 4.2 | ඉඩම් | අම්බලන්තොට වී අලෙවි මණ්ඩලය අසල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | අම්බලන්තොට වී අලෙවි මණ්ඩලය මඟින් ඉදිකරන ලද නිවාස 12ක අනවසර ලෙස පදිංචි වී සිටින අනවසරකරුවන් 04 දෙනෙකු ඉවත් කිරීමට සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය කර ඇති අතර අනෙක් 8 දෙනා සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති බවත්, 2015.06.26 පැවති පාර්ලිමේන්තු පෙත්සම්කාරක සභාවේ දී මෙම 12 දෙනාම ඉවත් කර ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දෙන ලෙස තීරණය කර ඇති බවත් මින් කුමන තීරණය ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව ගැටළුවක් ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙසත්, නගර සංවර්ධන සැලැස්මට අනුව විකල්ප ලබා දිය හැකි බැවින්, එම සැළැස්ම මීළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට / ගරු සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 4.3 | පොදු | අම්බලන්තොට ක්ෂිතිජය මධ්‍යස්ථානයේ ඇති ගැටළු | සමාජසේවා අමාත්‍යාංශයට මෙම ගොඩනැගිලි හා ළමුන් භාරගෙන ඉදිරි කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලද අතර, ඇස්තමේන්තුවක් ද ඉදිරිපත් කර ඇති බවට දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන බව දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 4.4 | ක්‍රීඩා සංවර්ධන | තලහගම්වාඩුව අරුණ ක්‍රීඩා සමාජයේ වෙරළ වොලිබෝල් ක්‍රීඩාපිටියට මුහුදු වැලි ලබා ගැනීම | මෙම ක්‍රීඩා පිටිය සඳහා මුහුදු වැලි කියුබ් 40ක් පමණ අවශ්‍ය වන බවත් ඒ සඳහා ප්‍රවාහන වියදම් ද ඇතුළුව රු.260,000.00 පමණ වැය වන බවත් එය සපයාගැනීමේ අපහසුතාවයක් පවතින බවත් ප්‍රකාශ කරන ලදි. | අවශ්‍ය වැලි වැලිපටන්විල ප්‍රදේශයෙන් ලබා දීමට හැකි බැවින් ප්‍රාදේශීය සභාවේ ටිපර් රථ යොදවා එම වැලි ප්‍රවාහනය කර දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ගරු සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල |
| **05** | **පළාත් පාලන ආයතනවලින් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| 5.1 | නිල නිවාස | හම්බන්තොට මහනගර සභාවේ සෞඛ්‍ය අංශයේ කම්කරුවන් සඳහා නිල නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | නිල නිවාස අබලන් තත්වයේ පැවතීම, ප්‍රමාණවත් යටිතල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම හේතුවෙන් කම්කරුවන් අපහසුතාවයට පත් වී ඇති බවත්, ඒ සඳහා සුදුසු භූමියක් හා ප්‍රතිපාදන සපයා ගැනීම අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි. | ඉඩම් ලබා දීමේ දී නිසි කළමනාකාරීත්වයකින් කටයුතු කළ යුතු බවටත්, නිවාස යෝජනා ක්‍රමවලදී මහල් නිවාස ක්‍රමය අනුගමනය කළ යුතු බවටත්, උපදෙස් ලබා දුනි. | නාගරික කොමසාරිස් - හම්බන්තොට මහ නගර සභාව / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 5.2 | ඉඩම් | සංවර්ධන කලාපවල ඉඩම් කට්ටි කිරීම නතර කිරීම | නව සංවර්ධන කළාපවල ඉඩම් කට්ටි කිරීම සිදුවන බවත්, වීරකැටිය, විතාරන්දෙනිය වැනි ප්‍රදේශවල බහුල වශයෙන් පොල් ඉඩම් කට්ටි කිරීම සිදු වන බැවින් ඉදිරි අවධානමක් පවතින බව ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු නතර කිරීමටත්, සම්බන්ධීකරණ කමිටුවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය යටතේ පමණක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදි. | සහකාර පළාත් පාලන කොමසාරිස් / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 5.3 | නගර සංවර්ධන | අඟුණකොළපැලැස්ස සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරමින් පවතින සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ නොයෙකුත් දූසිරිත් ව්‍යාප්තව පැතිරීම හා පරිසර දූෂනය සිදු වන බව ප්‍රකාශ කරන ලදි. | මෙම ගොඩනැගිල්ල විධිමත්ව යොදා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - අඟුණකොළ පැලැස්ස ප්‍රාදේශීය සභාව / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 5.4 | පොදු කටයුතු | අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට අනවසරයෙන් ඉදිකරනු ලබන තරුණ සම්පත් මධ්‍යස්ථානය පිළිබඳ ගැටළු | මෙම ගොඩනැගිල්ල 2008 වර්ෂයේ දී බදු පදනම මත රුහුණු සංවර්ධන පදනමට ලබා දී ඇති බවත්, 2010 වර්ෂයේ දී ගිවිසුම් අත්සන් කර ඇති බවත් පරිගණක මධ්‍යස්ථානය, කාර්ය වර්ධන මධ්‍යස්ථානය, නැණ සල සහ පුස්තකාලය | දිස්ත්‍රික් ලේකම්, නාගරික සංවර්ධන අධිකාරිය, සහ රුහුණු සංවර්ධන පදනමේ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට මේ සම්බන්ධ වාර්තාවක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | සංවර්ධනය සඳහා වෙන් කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. තව ද, සැලසුම් අනුමත කරගෙන නොමැති බැවින් නීත්‍යානුකූලව කටයුතු කරන බවට කරුණු දක්වන ලදි. | | |
| 5.5 | අධ්‍යාපන | වකමුල්ල කණිටු විදුහල පවත්වාගෙන යාම පිළිබඳ ගැටළු | මෙම පාසලේ අධ්‍යාපනය ලබන සීමිත සිසුන් ප්‍රමාණය පහසුකම් සහිත වෙනත් පාසලකට යොමු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි.<br>මේ වනවිට සිසුන් 53 දෙනෙකු අධ්‍යාපනය ලබන බවත් ගුරුවරුන් 16 දෙනෙකු සේවය කරන බවත්, මෙම පාසල වැසී යාමෙන් ආර්ථික දුෂ්කරතා සහිත දරුවන්ට අසාධාරණයක් සිදු වන බවත් ප්‍රකාශ කරන ලදි. | පාසල වසා දැමීම නොකළ යුතු දෙයක් වන බැවින් මෙය පෝෂිත පාසලක් ලෙස සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 5.6 | මත්ද්‍රව්‍ය නිවාරණ | මත්ද්‍රව්‍ය ඇබ්බැහිවූවන් සඳහා පුනරුත්තාපන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම | මේ සඳහා සුදුසු ඉඩමක් ලබාගත හැකි වේ නම් කඩිනමින් ගොඩනැගිල්ල ඉදිකර ඉදිරි කටයුතු සිදු කළ හැකි බව දන්වන ලදි.<br>මහවැලි බල ප්‍රදේශයෙන් මේ සඳහා ඉඩමක් ලබාගත හැකි බවට අදහස් ප්‍රකාශ විය. | භාවිතයට නොගන්නා සුදුසු භූමියක් සොයා කඩිනමින් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 5.7 | ඉඩම් | අඳැල්ල වැලිගත්ත ප්‍රදේශයේ ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීම නැවතීම සහ පොදු සුසාන භූමියක් නොමැති වීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | දීර්ඝ කාලයක් තිස්සේ මෙම ප්‍රදේශයේ පදිංචි වී සිටින පවුල් 58කින් පවුල් 17ක් සඳහා බලපත්‍ර ලබා දී ඇති අතර අනෙක් පවුල් සඳහා බලපත්‍ර ලබා දීම නතර කර ඇති බවත්, පොදු සුසාන භූමියක් නොමැති කමින් ප්‍රදේශවාසීන් අසීරුතාවයට පත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | මෙම ප්රදේශයේ මාර්ගය මන්තීරු 04ක් ලෙස සංවර්ධනය වන නිසා විකල්ප ඉඩම් ලබා දීම සුදුසු වන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාමය / විධායක ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.8 | මාර්ග සංවර්ධන | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මාර්ග සංවර්ධනයට අවශ්‍ය බොරළු ලබා ගැනීම සඳහා සුදුසු ඉඩමක් නොමැති වීම | මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය බොරළු පස් ලබා ලබාගැනීමට අක්කර 20ක භූමියක් වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටිය ද බොරළු නොමැති අක්කර 5ක භූමියක් වෙන් කර දී | සංවර්ධන කටයුතු සඳහා ප්‍රාදේශීය සම්පත් භාවිතා කිරීම අවශ්‍ය බටවත්, ඒ සඳහා බාධා නොවන පරිදි සියළු දෙපාර්තමේන්තු කටයුතු කළ යුතු බවටත් උපදෙස් ලබා දුන් අතර | සහකාර අධ්‍යක්ෂ - වනජීවී |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | ඇති බවත්, එය ප්‍රයෝජනවත් නොවන බැවින් ඉතිරි අක්කර 15ක ප්‍රමාණය වෙන් කර දෙන ලෙස වනජීවී දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කරන ලදි. | පාරිසරික හානිය අවම හා මහජන අවශ්‍යතා ඉටුවන පරිදි බොරළු ලබා ගැනීමේ පහසු ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි. | |
| 5.9 | මාර්ග සංවර්ධන | හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග කිහිපයක් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීම | නඩත්තු කිරීම සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් නොවන බැවින් ගොන්නොරුව සිට බඳගිරිය දක්වා මාර්ගය, දැහැම්පුර හංදිය සිට බැල්ලගස්වැව හංදිය දක්වා මාර්ගය, පල්ලෙමලල හංදිය සිට කැලියවැලැන දක්වා මාර්ගය, 10 කොලණිය හංදිය සිට කිරින්ද දක්වා මාර්ගය සහ දැහැම්පුර හංදිය සිට මැදගොඩට යන මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගන්නා ලෙස යෝජනා කරන ලදි. | ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන අතර, අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - හම්බන්තොට ප්‍රාදේශීය සභාව / මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.10 | අධ්‍යාපන | යහල්මුල්ල අබලන් වූ පාසල් ගොඩනැගිලි සහිත භූමිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම | වලස්මුල්ල බෝවල කොට්ඨාශයට අයත් දැනට ක්‍රියාත්ම නොමැති අබලන් වූ ගොඩනැගිලි සහිත පාසල් භූමිය ප්‍රාදේශීය සභාවට පවරාගෙන අධ්‍යාපන, සංස්කෘතික හෝ ආර්ථිකමය වටිනාකමක් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදි. | පළාත් කැබිනට් මණ්ඩලය මේ දිනවල ක්‍රියාත්මක නොවන නිසා පැවරීමේ බලය ගරු ආණ්ඩුකාරවර වෙත පැවරී ඇති බැවින් ඉල්ලීමක් කරන ලෙසත්, අධ්‍යාපන කාර්යයන් සඳහා පවරාගෙන ඇති ඉඩමක් වන බැවින් එවැනි කාර්යයන් සඳහාම භාවිතා කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - වීරකැටිය ප්‍රාදේශීය සභාව |
| **06** | **විශේෂ යෝජනා** | | | | |
| 6.1 | සමාජ සුභසාධන | ළමා අපයෝජන සම්බන්ධ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | මෙවැනි මධ්‍යස්ථානයක් හම්බන්තොට පිහිටුවීම තුළින් දිස්ත්‍රික්කයට මායිම්ව ඇති මොණරාගල, අම්පාර, බදුල්ල, රත්නපුර ප්‍රදේශ සඳහා ද සේවාවක් ලබා ගැනීමට හැකි බවත්, මේ සඳහා නව රෝහල් පරිශ්‍රයේ සුදුසු ඉඩක් ලබා දෙන ලෙසත් යෝජනා කරන ලදි. | නව රෝහලේ තවදුරටත් ගොඩනැගිලි ඉදිවන තෙක් පරණ රෝහලෙන් තාවකාලිකව ඉඩ ලබා දෙන ලෙසත්, අදාල ඇස්තමේන්තුව යොමු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6. 2 | වනජීවී | මත්තල ගුවන්තොටුපලට සිදුවන වන අලි තර්ජන අවම කර ගැනීම | මසකට ගුවන් යානා 27ක් සඳහා සේවා සපයන මත්තල ගුවන් තොටුපල භූමිය වෙත වන අලින් ඇතුළුවීම හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයක් උදා වී ඇති බවත්, ගුවන් තොටුපල වෙනුවෙන් වනජීවී නිලධාරීන් පිරිසක් අනුයුක්ත කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. | මේ සඳහා ගත හැකි පියවරයන් සොයා බලා දන්වන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) |
| 6.3 | මාර්ග සංවර්ධන | මාර්ගවල විදුලි ලාම්පු ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | ගුවන්තොටුපල පිවිසුම් මාර්ග, අධිවේගී පිවිසුම් මාර්ග සහ ගුවන් පාලම්වල විදුලි ලාම්පු ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වන සතුන්ගේ හානි සහ වෙනත් අනතුරු සඳහා ජනතාව මුහුණ දෙන බවට ප්‍රකාශ කරන ලදි. | අධිවේගී මාර්ගය මෙම මාසයේ දී විවෘත කිරීමේ දී ගුවන් තොටුපල මාර්ගයේ වීථි ලාම්පු ක්‍රියාත්මක වන බැවින් අනෙකුත් මාර්ග සඳහා කඩිනමින් විදුලි ආලෝකය ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රධාන ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 6.4 | මාර්ග සංවර්ධන | බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානය ඉදිරිපස ප්‍රධාන මාර්ගයේ සිදුවන රිය අනතුරු අවම කර ගැනීම. | උද්‍යානය නැරඹීම සඳහා විශාල ලෙස පාසල් ළමුන් ඇතුළු බොහෝ පිරිස් පැමිණෙන බැවින් ඉදිරිපස මාර්ගයේ වේගසීමා සහ සුදු බාධක යෙදීමට යෝජනා කරන ලදි. | වේගසීමා පැනවීම ගැසට් කළ යුතු බැවින් සුදු බාධක යොදන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රධාන ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 6.5 | පොදු කටයුතු | මිරිජ්ජවිල උද්භිත උද්‍යානයේ ඇති ගැටළු | චිත්‍රාගල - හම්බන්තොට නව ප්‍රධාන මාර්ගයට මුහුණ ලා උද්‍යානයේ පිවිසුම් දොරටුවක් ස්ථාපිත කර ඇතත්, පොදු ප්‍රවාහන පහසුකම් නොමැති වීම හේතුවෙන් නරඹන්නන් අපහසුතාවයට පත් වී ඇති බව ප්‍රකාශ කරන ලදි.<br>උද්‍යානයේ මල් වගා අංශය ඉදිරිපිට කැලෑ කොටසට රාත්‍රී කාලයේ දී කිසියම් පිරිසක් විසින් අපද්‍රව්‍ය ගෙනත් දැමීම හේතුවෙන් අධික දුර්ගන්ධයක් පවතින බව ප්‍රකාශ කරන ලදි.<br>රජයේ ආයතනවල සංවර්ධන කටයුතුවලදී කපා ඉවත් කරන මතුපිට පස් උද්‍යානයේ සංවර්ධනය සඳහා යොදා ගැනීමට යෝජනා කරන ලදි. | විද්‍යුත් බස් සේවාවක් (Electronic Bus Service) ස්ථාපිත කිරීම සුදුසු බැවින් ඒ සම්බන්ධ ඉල්ලීමක් අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි<br>මේ පිළිබඳව සොයා බලා අදාල පුද්ගලයන්ට නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දුනි.<br>මාර්ග සංවර්ධන කටයුතුවලදී සහ අනෙකුත් ආයතන විසින් එසේ ඉවත් කරන පස් ඇත්නම් ලබා දෙන ලෙස ද, එවැනි ව්‍යාපෘති හඳුනාගෙන දිස්ත්‍රික් ලේකම් දැනුවත් කරන ලෙස ද උපදෙස් ලබා දුනි. | කාර්ය භාර නිලධාරී - මිරිජ්ජවිල උද්භිත උද්‍යානය<br>ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී - හම්බන්තොට<br>ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / කාර්ය භාර නිලධාරී - මිරිජ්ජවිල උද්භිත උද්‍යානය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6.6 | පොදු සේවා | ප්‍රදේශයේ සුනඛ ගහනය පාලනය කිරීම | සුනඛයන් බෝ වීම පාලනය කිරීම සඳහා වන්ද්‍යාකරණය මේ වන විට ක්‍රියාත්මක වන බවත්, එම ප්‍රමාණය ඉතාමත් අවම බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>අයාලේ යන සුනඛයන් රැකබලාගැනීම සඳහා අක්කර 05ක පමණ භූමියක් අවශ්‍ය වන බවත්, උද්දකන්දර ප්‍රදේශයේ ඒ සඳහා ඉඩමක් හඳුනාගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදි. ඒ සඳහා පශු වෛද්‍ය සහාය ඉල්ලා සිටින ලදි. | දිස්ත්‍රික්කයේම සුනඛයන් ගාල් කිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදි. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපිත පශු වෛද්‍ය කණ්ඩායමේ සහාය ලබා ගැනීම සුදුසු බවට දන්වන ලදි. | ගරු සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 6.7 | කජු සංවර්ධනය | කජු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා මයුරපුර කිරි නිෂ්පාදන ගොඩනැගිල්ල ලබා ගැනීම | උඩමලල මයුරපුර ප්‍රදේශයේ පිහිටි දැනට ප්‍රයෝජනයට නොගන්නා කිරිනිෂ්පාදන ගොඩනැගිල්ල සුදුසු බවට යෝජනා කරන ලදි.<br><br>තිස්ස, ලුණුගම්වෙහෙර, සූරියවැව ප්‍රදේශවල වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම කාර්යාලය උපයෝගී කර ගන්නා බව ප්‍රකාශ කරන ලදි. | කිරි නිෂ්පාදන සමූපකාර සමිතියට මෙම ගොඩනැගිල්ල හිමි වන බැවින් එම සමිතියේ නිලධාරීන් කැඳවා සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.<br>කජු වගාව හා ඵලදාව පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉඩම ලබා දීම සම්බන්ධව සලකා බැලීම සුදුසු බවට තීරණය විය. | ප්‍රාදේශීය කළමනාකරු - ශ්‍රී ලංකා කජු සංස්ථාව |
| 6.8 | තරුණ කටයුතු | ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳව දැනුවත් කිරීම | තාරුණ්‍යයේ අදහස් හා මතවාද ජාතික සංවර්ධනය හා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් ලබාගැනීම සඳහා තරුණ ප්‍රජාවගේ කුසලතා සංවර්ධනය කිරීම උදෙසා ක්‍රියාත්මක වන මෙම මැතිවරණය පෙබරවාරි 14 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත්, අවු. 18-29 අතරේ සෑම තරුණයෙකුටම ඡන්දය ලබා දීමට හැකි බවත්, පෙබරවාරි 7 සහ 8 දිනවල නාමයෝජනා භාරගැනීම සිදුකරන බවත්, බැනර්, කටවුට් මඟින් ප්‍රචාරණ කටයුතු කිරීම තහනම් වන බවත් ප්‍රකාශ කරන ලදි. | ප්‍රදේශයේ තරුණයන්ගෙන් ලැප්ටොප් පරිගනක සපයා ගැනීමට කටයුතු කරන ලෙසත්, අන්තර්ජාල සම්බන්ධතාවය ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා ගන්නා ලෙසත් උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - තරුණ සේවා සභාව |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුල් කර ගනිමින් මධ්‍යස්ථාන 12ක් යටතේ ඡන්දය ක්‍රියාත්මක වන බවත්, ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී ඇති බවත්, ඒ සඳහා අවශ්‍ය කරන පරිගණක සපයාගැනීමට සහ මෙහෙයවන නිලධාරියෙකුගේ සහාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි. | | |
| 6.9 | මාර්ග සංවර්ධන | කදිරගොඩ - ලේනමුල්ල පාරේ බැම්ම ඉදිකිරීමේ කටයුතු සම්බන්ධ ගැටළු | ජල ගැලීම්වලදී මාර්ගය යට වන බැවින් පාසල් ළමුන් හා ජනතාව අපහසුතාවයට පත්වන බවත්, ඒ සඳහා පදික වේදිකාවක් ඉදිකිරීම සුදුසු බවත් යෝජනා කරන ලදි.<br>මාර්ගයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින අතර පදික වේදිකාවක් ඉදිකිරීම ඇස්තමේන්තුවේ ඇතුලත් නොවන බව ප්‍රකාශ කරන ලදි. | ඒ සඳහා වෙනම ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ඉංජිනේරු - තංගල්ල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| **07** | **දේශපාලන නායකත්වයෙන් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| **7.1** | **විදුලිබල හා බලශක්ති සහ මගී ප්‍රවාහන සේවා කළමනාකරණ ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා** | | | | |
| 7.1.1 | ඉඩම් | සිරිබෝපුර වාණිජ කලාපයට තොරාගත් ඉඩම් වෙනුවෙන් දීමනාපත්‍ර ලබා ගැනීම | සිරිබෝපුර ග්‍රාම නිලධාරී වසමේ අත්තම් නිවාස සහ කපුවත්ත යන ගම්මානවල වාණිජ කලාපයට තෝරාගත් ඉඩම් වෙනුවෙන් මෙතෙක් වන්දි මුදලක් ගෙවා නොමැති බවත්, ලබා දී ඇති සුනාමි නිවාස සඳහා නිදහස් දීමනාපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | එකී ඉල්ලීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **7.2** | **හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චි මැතිතුමා** | | | | |
| 7.2.1 | මාර්ග සංවර්ධන | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කනුකැටිය මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම | මෙම මාර්ගයේ කොටසක් පමණක් කාපට් අතුරා සංවර්ධනය කර ඇති බව ප්‍රකාශ කරන ලදි. | මං මාවත් කඩිනමින් කාපට් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වීමට නියමිත කිලෝමීටර ලක්ෂයේ ව්‍යාපෘතියට ඇතුළත් කර ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7.2.2 | ධීවර කටයුතු | කලමැටිය ධීවර වරාය දක්වා මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම | පාසල් ළමුන්, ධීවර ප්‍රජාව සහ සමාන්‍ය ජනයා වෙත පහසුකම් සපයන මෙම මාර්ගයේ කොටසක් පමණක් සංවර්ධනය වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | කිලෝමීටර ලක්ෂයේ ව්‍යාපෘතියට මෙම මාර්ගය ද ඇතුළත් කර ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7.2.3 | ඉඩම් | බටඅත හාමු කන්ද ප්‍රදේශයේ කොරියානු අධාර මත ඉදිකරන ලද නිවාස සඳහා විදුලිය සහ නල ජලය ලබා දීම | පදිංචිකරුවන් අනවසරකරුවන් වන අතර, මේ සම්බන්ධයෙන් ඉඩම් කච්චේරියක් පැවැත්වීම කොන්දේසි 04ක් යටතේ පැවැත්වීමට පළාත් ඉඩම් කොමසාරිස් විසින් උපදෙස් ලබා දී ඇති බවත්, අනවසර පදිංචිකරුවන්ට බලපත්‍ර ලබා දීම වැරදි පූර්වාදර්ශයක් වන බවත් ප්‍රකාශ කරන ලදි. | අනවසර ඇතුල්වීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර සතියක් ඇතුළත වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් |
| 7.2.4 | ධීවර කටයුතු | කලමැටිය ධීවර වරායේ ඉතිරි වී ඇති ඉදිකිරීම් කටයුතු නිම කර විවෘත කිරීම හා ගිනිගත් ධීවර බෝට්ටු සඳහා වන්දි ලබා දීම | මේ වන විට 95% පමණ කටයුතු අවසන් වී ඇති බව වාර්තා විය.<br><br>ධීවරයන්ගේ බෝට්ටු ගිනිතැබීම නිසා ධීවරයන්ට රු.ලක්ෂ 50 බැගින් ලබා දීමට කැබිනට් අනුමැතිය ලබාගෙන ඇති බව ප්‍රකාශ කරන ලදි. | <br><br><br><br>එම කාර්යයන් සඳහා මුදල් වෙන් වී නොමැති නිසා ඉදිරියේ දී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මුදල් වෙන් කර දීමට කටයුතු කරන බව දන්වන ලදි. | සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ධීවර කාර්යාලය<br><br>සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ධීවර කාර්යාලය |
| 7.2.5 | ධීවර කටයුතු | පට්ටිය වරාය මා දැල් තොටුපලෙහි කිසියම් පිරිසකගේ බලහත්කාරී ක්‍රියාකාරකම් හේතුවෙන් මතු වී ඇති ගැටළු | මා දැල් ධීවරයන් විශාල පිරිසකට සෙත සැලසීම සඳහා මෙම ගැටළුව කඩිනමින් විසඳිය යුතු බවට අදහහස් ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ධීවර කාර්යාලය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **7.3** | **හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී.වී. චානක මැතිතුමා** | | | | |
| 7.3.1 | ජල සම්පාදන | ඉහලගම ප්‍රජාජල ව්‍යාපෘතිය ජල සම්පාදන මණ්ඩලයට පවරා දීම | මෙම ව්‍යාපෘතිය හරහා ජල සම්පත් මණ්ඩලයෙන් තොග ජලය ලබා ගෙන ජනතාවට බෙදාහැරීම සිදු කරන බැවින් එක් ඒකකයක් සඳහා රු. 30ක මුදලක් ගෙවීමට පාරිභෝගිකයන්ට සිදු වී ඇති බවත්, මෙම ව්‍යාපෘතිය ජල සම්පත් මණ්ඩලයට පවරා දීම මඟින් එම ගැටළුව විසඳා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 7.3.2 | ජල සම්පාදන | අඟුණකොළපැලැස්ස මහජදුර ප්‍රදේශයේ පානීය ජල ගැටළුව | මෙම ගම්මානයට මීටර 500ක් දුරින් ජල සැපයුම් මාර්ගය නැවතී ඇති බවත්, ඒ හේතුවෙන් ගම්වාසීන් ප්‍රදේශයේ නල ළිඳකින් ජලය ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදි. | බරවකුඹුක ජල ව්‍යාපෘතියෙන් එම ප්‍රදේශයට ජලය ලබා දීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | ප්‍රාදේශී කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |
| 7.3.3 | කෘෂිකර්ම | වීරවිල සත්ත්ව ගොවිපලට අයත් ඉඩම නඩත්තු කිරීමට කිරි ගොවීන්ට අවසර ලබා දීම | වීරවිල ප්‍රදේශයේ අක්කර 1000ක භූමි ප්‍රමාණයක ගවයින් රඳවා ඇති බවත්, ඊට යාබදව නටඹුන් වැව් කිහිපයක් ද පවතින බවත් ප්‍රකාශ කරන ලදි. එම වැව් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස සහ එම ඉඩම් ලිඛිත ගිවිසුමක් මඟින් කිරි ගොවීන්ට ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.<br>වන ජීවී කලාපයට අයත් ද යන්න පිළිබඳව ගැටළුවක් පවතින බව ප්‍රකාශ කරන ලදි. | අදාල නිලධාරීන් හා කිරි ගොවීන් සමඟ සාකච්ඡා කොට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය / ලුණුගම්වෙහෙර |
| 7.3.4 | ජල සම්පාදන | වැව්දත්ත ග්‍රාම නිලධාරී වසමේ පානීය ජල ගැටළුව | වැව්දත්ත ප්‍රදේශයේ දැනට පවුල් 75ක් සඳහා පිරිසිදු පානීය ජලය නොලැබෙන බවත්, ජලය රැගෙන ඒමට කිලෝමීටරයක් පමණ දුර ගෙවා යාමට සිදු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | මාතර පලපත ව්‍යාපෘතියෙන් මෙම ප්‍රදේශය ආවරණය වන බවට කරුණු ඉදිරිපත් වූ අතර, ඒ සඳහා වාර්තාවක් ලබා දෙන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශී කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| **7.4** | **දකුණු පළාත් සභාවේ ගරු සභාපති කේ.ඒ. සෝමවංශ මැතිතුමා** | | | | |
| 7.4.1 | මාර්ග සංවර්ධන | රළුව මැනුම්වත්ත ගම් දෙක යා කරමින් ඌරුබොකු ඔය හරහා ඉදිකෙරෙන පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන් කර විවෘත කිරීම | 2012 වර්ෂයේ ආරම්භ කර 75% ක වැඩ අවසන් කර ඇති අතර 2015න් පසුව ඉදිකිරීම් නතර කර ඇත. | නැවත ඉදිකිරීම් ආරම්භ කරන ලෙසත්, අඩක් ඉදිකර ඇති සියළුම පාලම් සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| **08** | **වෙනත් කරුණු** | | | | |
| 8.1 | ජල සම්පාදන | ජල සම්පාදන ව්‍යාපෘතිවල ප්‍රගතිය | අඟුණකොළපැලැස්ස බන්ධනාගාර ජල ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතින බවත්, මාස 3ක් ඇතුළත නිමා කළ හැකි බවත්, කිරම කටුවන ජල ව්‍යාපෘතිය වසර 2ක් ඇතුළත නිම කළ හැකි බවත්, වකමුල්ල ජල යෝජනා ක්‍රමයේ ජල අවශ්‍යතාවයට ප්‍රමාණවත් ධාරිතාවක් නොමැති බවත්, තිස්ස - කතරගම ජල ව්‍යාපෘතිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.<br>දෙබරවැව ජල ව්‍යාපෘතිය කොන්ත්‍රාත් ආයතනය වන SD&CC ආයතනයේ අභ්‍යන්තර මූල්‍ය ගැටළුවක් හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බවත්, ව්‍යාපෘතියේ කටයුතු නිමවන තෙක් ජල බූලි අවශ්‍ය වන බවත් ප්‍රකාශ කරන ලදි. | එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කරන ලෙස උපදෙස් ලබා දුනි.<br>අවශ්‍ය ජල බූලි ප්‍රමාණය ආපදා කළමනාකරණ අංශය මඟින් ලබා දීමට තීරණය විය. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>දිස්ත්‍රික් ආපදා සහන නිලධාරී |
| 8.2 | ජල සම්පාදන | ප්‍රාදේශීය සභාවෙන් බවුසර මඟින් බෙදාහරින ජලය සඳහා මුදල් අයකිරීම | මහජනතාවගේ ජල අවශ්‍යතාවය සපුරා දීම ජල සම්පාදන මණ්ඩලයේ කාර්යභාරය වුව ද, ඇතැම් ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සභාව විසින් බවුසර මඟින් ජලය සැපයීමේ දී එම ජලය සඳහා ගාස්තු අයකිරීම ගැටළු සහගත වේ.<br>ලුණුගම්වෙහෙර ජල ටැංකියෙන් ජලය ලබා ගැනීමේ දී විශේෂ අවසරයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | පානීය ජලය බෙදාහැරීම සඳහා බවුසරවලට ලබා දීමේ දී ජලය සඳහා ගාස්තු අය නොකළ යුතු බවට තීරණය විය. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන මණ්ඩලය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 8.3 | වන ජීවී | ගොන්නෝරුව ප්‍රදේශයේ වන අලි තර්ජන වැඩි වීම. | ඉදිකර ඇති අලි වැටවල්වල විදුලිය අඩු වීම සහ විදුලි වැට ඇද වීම හේතුවෙන් අලින් ගමට ඇතුළු වන බව ප්‍රකාශ කරන ලදි.<br><br>රක්ෂිත සීමාවන්වල වැට ඉදිකරන බැවින් වැට වංගු සහිත වන බවත්, මහවැලි අධිකාරියට අයත් ලඳු කැලෑවල දිවා කාලයේ සැඟවී සිට රාත්‍රී කාලයේ දී අලින් ගම්වලට ඇතුළු වන බවත් ප්‍රකාශ කරන ලදි. | වන අලි තර්ජන අවම කර ගැනීම සඳහා අලිමංකඩවල් එලි පෙහෙලි කිරීමට කටයුතු කරන ලෙසත්, අධිවේගී මාර්ග සංවර්ධනයේ දී ගුවන් පාලම් මඟින් අලි මංකඩවල් නිදහස් කරන ලෙසත්, vertical garden සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) / දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 8.4 | ධීවර | තිස්සමහාරාම ධීවර ගම්මානයේ ඉදිකිරීම් කටයුතු නිම නොවී මුදල් ගෙවීම | කාවන්තිස්සපුර ගම්මානයේ ඉදිකිරීම් කටයුතු නිම ප්‍රතිලාභීන් සඳහා ආධාර මුදල් ලබා දී ඇති බවට වාර්තා විය. | මේ සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය |
| 8.5 | අධ්‍යාපන | වලස්මුල්ල ප්‍රදේශයේ පාසල් සඳහා ළමුන් ඇතුලත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ දී ගැටළු කාරී තත්ත්වයක් පවතින බවත්, ආසන්න පදිංචි අයට පාසල අහිමි වන අතර, දුර සිට ළමයින් ඇතුළත් කර ගැනීම ද ගැටළු සහගත බවට කරුණු ඉදිරිපත් විය. | අමාත්‍යාංශ ලේකම්ගෙන් ලිපියක් රැගෙන එන ලෙස ඇතැම් නිලධාරීන් දෙමාපියන්ට උපදෙස් දෙන අතර දෙමාපියන් දේශපාලන අධිකාරිය වෙත එම ගැටළු දේශපාලන අධිකාරිය වෙත ඇවිටිලි කිරීම නුසුදුසු තත්ත්වයක් බවත් ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නම් එය නිලධාරීන් විසින් කරගන්නා ලෙසත්, පාසලට ළමුන් ඇතුළත් කිරීම සඳහා දේශපාලන අධිකාරිය මැදිහත් නොකිරීමට වගබලා ගත යුතු බවත් දන්වන ලදි. තව ද දෙමාපියන් අපහසුතාවයට පත් නොවන ආකාරයට විදුහල්පතිවරයාගේ සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළු නිලධාරීන් එක්ව කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දුනි. | සියළුම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු |
| 8.6 | අධ්‍යාපන | අධ්‍යාපන නිපුනතා සංවර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම | හම්බන්තොට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පෙබරවාරි 29 වනදා සිට මාර්තු 01 වන දින දක්වා අධ්‍යාපන නිපුනතා | සියළුදෙනාගේම සහයෝගය ලබා ගනිමින් කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | වෘත්තීය පුහුණු අධිකාරිය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන බවත්, නව නිපැයුම්, නව ව්‍යවසායකයන් සඳහා වෘත්තීය පුහුණු ඇතුළු බොහෝ වැඩසටහන් ඊට සමගාමීව ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදි. | | |
| 8.7 | කෘෂිකර්ම | අම්බලන්තොට රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ ගැටළු | ගොවිපල ආසන්නයේ ඇති අනවසර ඉදිකිරීම් හේතුවෙන් ජල බස්නාව අවහිර වීම නිසා බීජ නිෂ්පාදන කටයුතු සඳහා බාධා මතු වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව |
| 8.8 | පරිසර සංරක්ෂණ | අනවසර නළ ළිං ඉදිකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | වැලි සේදීම සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතියෙන් තොරව නළ ළිං හැරීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බව වාර්තා විය. | අනවසර නළ ළිං ඉදිකිරීම නතර කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | ජල සම්පත් මණ්ඩලය |

2020 වසරේ පළමුවන සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සියළු දෙනා සහභාගී වීම සම්බන්ධයෙන් සතුටු වන බවත්, මේ වසරේ දී ග්‍රාමීය ආර්ථිකය නංවාලීම ප්‍රමුඛ කර ගත් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වීමට නියමිත බවත්, නව නගර නිර්මාණයට ප්‍රමුඛතාවය ලබා දෙන බවත්, ඒ සඳහා සියළුම දෙනාගේ සහයෝගය අපේක්ෂා කරන බවත්, ප්‍රකාශ කරන ලද අතර, පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේ දී දේශපාලන අධිකාරිය මැදිහත් කර නොගැනීම, මත් ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානය කඩිනමින් ස්ථාපිත කිරීම හා ඩෙංගු රෝග මර්ධනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තුතිය පිරිනැමීමෙන් අනතුරුව ප.ව 1.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

සී.ඒ. සුනෙත් ලෝචන
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති (රාජකාරි ආවරණය)
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

සී.ඒ.සුනෙත් ලෝචන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
රාජකාරි ආවරණ
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2020 ~~ජනවාරි~~ පෙබරවාරි මස ...11.......... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.